සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Centre
De Mazenod College
Kandana
26351

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 1 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

උපදෙස්
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

සැලකිය යුතුය :
- **පහත සිද්ධිය ඇසුරින් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.**

හික්කඩුව ප්‍රදේශයේ වාසය කරන සසිදු උසස් පෙළ විභාගයෙන් සරසවි වරම් නොලැබුවද, තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහසින් බතික් ආශ්‍රිත නිර්මාණ පිළිබඳ පාඨමාලාවක් ජාතික ශිල්ප සභාවෙන් හදාරන ලදී. තම පියාගේ ද මූල්‍ය දායකත්වය ඇතිව ''සසිඳු බතික්'' නමින් බතික් ආශ්‍රිත ඇඟළුම් නිපදවීමේ ව්‍යාපාරයක් අරඹන ලදී. ප්‍රදේශයට පැමිණෙන දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේ ආකර්ශණය මෙන්ම ඉල්ලුමද බතික් ඇගලුම් සඳහා දිනෙන් දින වැඩි විය.

01. 'සසිදු බතික්' ව්‍යාපාරය විසින් සපුරාලන ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
1. ආහාර 2. ඇඳුම් 3. ආරක්ෂාව 4. විනෝදය

02. ඇගළුම් නිෂ්පාදනයට යොදා ගන්නා බතික් රෙදි අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,
1. භූමිය 2. ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසායකත්වය

03. 'සසිදු බතික්' ව්‍යාපාරය හිමිකාරිත්වය අනුව අයත්වන ව්‍යාපාර සංවිධානය වනුයේ,
1. පොදු ව්‍යාපාර 2. තනි පුද්ගල ව්‍යාපාර 3. හවුල් ව්‍යාපාර 4. සමිති සමාගම්

04. සසිඳුගේ ව්‍යාපාරයට අයත් වන අභ්‍යන්තර පරිසර සාධකයක් වනුයේ,
1. විදේශීය සංචාරකයින් 2. සසිදුගේ පියා 3. සසිදු 4. දේශීය සංචාරකයින්

05. සසිදු බතික් ව්‍යාපාරය ලියාපදිංචි කල යුතු වන්නේ,
1. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව
2. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥාපනතට අනුව
3. 1840 ට වංචා වැලැක්වීමේ පනතට අනුව
4. 1890 හවුල් ආඥා පනතට අනුව

06. ඡායාරූපකරණය ආශ්‍රිතව තමාගේම ව්‍යාපාරයක් කරගෙන යන කලිඳු, ඡායාරූපකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හැදෑරීම එම ව්‍යාපාරයට,
1. ශක්තියකි. 2. අවස්ථාවකි. 3. දුර්වලතාවයකි 4. තර්ජනයකි.

07. සමුපකාර සමිතිවල වාසියක් මෙන්ම ලක්ෂණයක්ද වන්නේ,
1. ආර්ථික ප්‍රතිලාභ බෙදීයාම.
2. ප්‍රජාතන්ත්‍ර වාදී පාලනයක් පැවැතීම.
3. සාමාජිකයින්ගේ සාමූහික අයිතිය.
4. පවත්වාගෙන යාමට විවිධ රාජ්‍ය අනුග්‍රහ හිමිවීම.

08. චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ දැක්වෙන අංක අනුපිළිවෙලින් වන්නේ,
1. බැංකු අංකය, චෙක් අංකය, බැංකු ශාඛා අංක, බැංකු ගිණුම් අංකය
2. බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, චෙක් අංකය, බැංකු ගිණුම් අංකය
3. බැංකු ගිණුම් අංකය, චෙක් අංකය, බැංකු ශාඛා අංකය, බැංකුවේ අංකය
4. චෙක් අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, බැංකු ගිණුම් අංකය

09. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන්හි වැදගත් කමක් නොවන්නේ,
1. අමතර පිරිවැයක් දැරීමට සිදු වීම.
2. ක්ෂණික බව
3. අවදානම අඩුවීම.
4. දත්ත විනාශවීමේ අවදානමක් නොමැති වීම.

10. පහත ප්‍රකාශ අතුරින් තොග වෙළෙඳාමට උදාහරණයක් වන්නේ,
1. ජංගම රථයක් මගින් පරිභෝජනයට එළවළු මිලදී ගැනීම.
2. සිල්ලර වෙළඳසැලට වී ගබඩාවෙන් කිලෝ 50 ක් මිලදී ගැනීම.
3. කොන්ත්‍රාත් කරුවකු නිවසක් තැනීමට ගඩොල් 1000 ක් මිලදී ගැනීම.
4. වාර්ෂිකව ක්‍රීඩා උත්සවය සඳහා බනිස්ගෙඩි 500 ක් මිලදී ගැනීම.

11. රක්ෂණයට සම්බන්ධ පාර්ශව අතුරින් "රක්ෂකයා" යනු සැම විටම,
1. රක්ෂණ අවරණ ලබන පාර්ශවය
2. බලපෑමට ලක්වන අනිකුත් සියලුම පාර්ශව
3. රක්ෂණ ආවරණය ලබා දෙන පාර්ශවය
4. ගිවිසුමෙන් බලපෑමක් වන සියලුම දේපල

12. පහත දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංග වේ.




(A), (B) හා (C) වලට අදාල නිවැරදි මූලිකාංගය වනුයේ,
1. ලබන්නා, පණිවිඩය, ප්‍රතිචාරය
2. ප්‍රතිචාරය, ලබන්නා, පණිවිඩය
3. පණිවිඩය, ප්‍රතිචාරය, ලබන්නා
4. පණිවිඩය, ලබන්නා, ප්‍රතිචාරය

13. ප්‍රවාහනයේ මූලිකාංගයක් වන මාධ්‍යය සඳහා නිදසුන් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
1. දුම්රිය මාර්ග, ජල මාර්ග, ගුවන් මාර්ග, මහා මාර්ග
2. බස්, දුම්රිය, නැව්, ගුවන් යානා
3. සූර්ය බලය, ගෑස්, විදුලිය, ඉන්ධන
4. බස් නැවතුම, වරාය, දුම්රිය ස්ථානය, ගුවන්තොටුපල

14. රත්දොළගම මැදි විදුහලේ වාණිජ විද්‍යා සංගමය විසින් වාණිජ දිනයක් පැවැත්වීමට අදහස් කරයි. ඒ සඳහා අනුගමනය කිරීමට අපේක්ෂාකරන පියවර කිහිපයක් පහත වේ. මෙයින් සැලසුම් කරණයට අදාල කාර්ය වන්නේ,
1. කාර්යයන් අනුව කමිටු පත් කිරීම.
2. කමිටු නායකයින් සාමාජිකයන් නම් කිරීම.
3. ඒ ඒ කමිටු නිසි අයුරින් සිදුවේදැයි සොයාබැලීම.
4. වාණිජ දිනය සඳහා තේමාවක් තීරණය කිරීම.

15. භාණ්ඩ හා සේවා අලෙවිකරණ මිශ්‍රය තුල ඇතුලත් ආදායම් ඉපයීම් සම්බන්ධව වඩාත් නිවැරදිව විචල්‍යය,
1. මිල
2. ස්ථානය
3. නිෂ්පාදිතය
4. ප්‍රවර්ධනය

16. සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධකයක් වන්නේ,
1. ආයෝජනය කිරීමේ පහසුව
2. ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ
3. කොටස්වල ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම
4. ඉඩම්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලී ආදායම

17. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,
   1. ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද දැනගැනීමට
   2. ව්‍යාපාරයේ මූල්‍ය තත්තවය සතුටු දායක යන්න දැන ගැනීමට
   3. ව්‍යාපාරය කෙරෙහි තීරණ ගැනීමට අවශ්‍ය වන පාර්ශවවලට තොරතුරු සැපයීමට
   4. පවතින නීතිමය අවශ්‍යතා ඉටුකිරීමට

18. වැඩිවීම බැර අඩුවීම හර යන ද්විත්ව සටහන් මූලධර්මය අදාලවන ගිණුම් වර්ග වන්නේ,
   1. වියදම් හා ආදායම් ගිණුම්
   2. හිමිකම් හා වියදම් ගිණුම්
   3. වගකීම් හා වත්කම් ගිණුම්
   4. ආදායම් හා හිමිකම් ගිණුම්

- පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 19 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කමලිනිගේ ව්‍යාපාරයේ 2024 ඔක්තෝම්බර් මාසයට අදාලව සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත වේ.

A - රු. 50,000 ක බැංකු ණයක් ලබා ගැනීම.
B - රු. 15,000 ක බඩුතොගක් රු. 20,000 කට ණයට විකිණීම.
C - රු. 10,000 ක උපකරණ අත්පිට මුදලට ගැනීම.
D - රු. 3,000 ක සැප්තැම්බර් මස විදුලිබිල ගෙවීම.

19. කමලිනිගේ ව්‍යාපාරයේ වගකීම් වැඩිවීමට බලාන ගනුදෙනුවක් වනුයේ,
   1. D  2. C  3. B  4. A

20. 2024-10-31 දිනට ව්‍යාපාරයේ හිමිකම වෙනස් වී ඇත්තේ,
   1. රු. 5000 කින් වැඩි වී ඇත.
   2. රු. 3000 කින් අඩු වී ඇත.
   3. රු. 2000 කින් අඩු වී ඇත.
   4. රු. 2000 කින් වැඩි වී ඇත.

21. කමලිනිගේ ව්‍යාපාරයේ 2024 ඔක්තෝම්බර් මස 31 දිනට අවසාන මුදල් ශේෂය වන්නේ,
   1. රු. 60,000 කි.  2. රු. 57,000 කි.  3. රු. 47,000 කි.  4. රු. 37,000 කි.

22. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ගිණුම්කරණ සමීකරණය දැක්වෙන්නේ,
   1. හිමිකම = වත්කම් + වගකීම්
   2. වත්කම = හිමිකම + වගකීම
   3. වගකීම = හිමිකම – වත්කම්
   4. හිමිකම = වගකීම – වත්කම

23. පහත දැක්වෙන්නේ මූලික සටහන් පොත් හා මූලාංශ ලේඛණ කිහිපයකි.

| මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛණය |
|---|---|
| 1. මුදල් පොත | A ජර්නල් වවුචරය |
| 2. ණයට ගැනුම් ජර්නලය | B සුළු මුදල් ගෙවීම් වවුචරය |
| 3. පොදු ජර්නලය | C ලදු පත |
| 4. සුළු මුදල් පොත | D ගැනුම් ඉන්වොයිසය |

ඉහත මූලික සටහන් පොතට අදාලව මූලාශ්‍ර ලේඛණ අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි වන්නේ,
   1. B C D A  2. A C D B  3. C D A B  4. D C A B

24. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
   (A) යම් ගනුදෙනුවක් සිදුවීමේදී සිදුවිය හැකි වට්ටම් වර්ග වනුයේ වෙළඳ වට්ටම් හා මුදල් වට්ටම්ය.
   (B) දුන් වට්ටම් හා ලද වට්ටම් අදාල වනුයේ මුදල් වට්ටම සඳහා පමණි.
   (C) මුදල් වට්ටම් ද්විත්ව සටහන් රීතියට අනුව ගිණුම්ගත කරයි.
   (D) මුදල් වට්ටම් මුදල් පොතෙහි සටහන් කිරීමට යොදා ගන්නේ සිහිවටන තීරුවයි.
   1. A හා B පමණි.  2. A, B හා C පමණි.  3. A, B හා D පමණි.  4. A, C හා D පමණි.

25. සුළු මුදල් අග්‍රිමය සෑම විටම ප්‍රතිපූරණය කළ යුත්තේ,
   1. මාසය අවසානයේදීය.
   2. සුළු මුදල් අග්‍රිමය අවසාන වීමට ආසන්න වූ විටය.
   3. සුළු මුදල්භාර කරු කැමති වූ අවස්ථාවකදීය.
   4. ප්‍රධාන මුදල්භාර කරු දැන්වූ විටය.

26. බැංකු අයිරාව ව්‍යාපාරයකට
1. ජංගම වත්කමකි.
2. ජංගම නොවන වත්කමකි.
3. ජංගම වගකීමකි.
4. ජංගම නොවන වගකීමකි.

27. තැන්පත් කළ චෙක්පතක් අගරු වීම සටහන් කිරීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,
1. ණය ගැති ගිණුම හර - බැංකු ගිණුම බැර
2. බැංකු ගිණුම හර - ණය ගැති ගිණුම බැර
3. ණය ගැති ගිණුම හර - ණය හිමි ගිණුම බැර
4. ණය හිමි ගිණුම හර - බැංකු ගිණුම බැර

28. පහත ගනුදෙනු අතුරින් පොදු ජර්නලයෙහි සටහන් කරනු ලබන ගනුදෙනුවක් වන්නේ,
1. රු. 5000 ක් ණය ගැතියකුගෙන් ලැබීම.
2. රු. 10,000 ක බඩු තොග ණය පදනම මත මිලදී ගැනීම.
3. ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා රු. 50,000/= ක් වටිනා යන්ත්‍රයක් ණය පදනම මත ලබා ගැනීම.
4. රු. 20,000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 30,000 කට කමල්ට ණයට විකිණීම.

29. ටෙලි බැංකු සේවා මගින් ව්‍යාපාරිකයකුට ඉටුකර ගත හැකි කාර්යයන් වන්නේ,
1. ගිණුමකින් තවත් ගිණුමකට මුදල් මාරුකිරීම.
2. මූල්‍ය ගනුදෙනු ඉතා ඉක්මනින් සපුරා ගත හැකි වීම.
3. කාලය හා ශ්‍රමය ඉතිරි වීම.
4. ව්‍යාපාරික ගනුදෙනු කිරීම පහසු වීම.

30. ශේෂ පිරික්සුම සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. ශේෂ පිරික්සුම යනු හර හා බැර වශයෙන් සඳහන් ලෙජර් ගිණුමකි.
2. ගිණුම් කාලච්ඡේදය අවසානයේ ලෙජර් ගිණුම් වල හර හා බැර ශේෂ දක්වන ලේඛණයකි.
3. ශේෂ පිරික්සුමක හර තීරුවේ එකතුව බැර තීරුවේ එකතුව සැම විටම සමාන වේ.
4. ශේෂ පිරික්සුම සැම විටම ද්විත්ව සටහන් රීතියට අනුව පිළියෙළ කරයි.

31. රු. 40,000 ක ණයට විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජර්නලයේ සටහන් නොවීම ගිණුම් කරන ක්‍රියාවලියේදී,
1. මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කිරීමේදී ඇති වූ වරදකි.
2. මූලික සටහන් පොත්වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේදී වූ වරදකි.
3. ලෙජර් ගිණුම් තුලනය කිරීමේදී ඇති වූ වරදකි.
4. ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමේදී ඇති වූ වරදකි.

32. රු. 53,000 ක අත්පිට විකුණුම මුදල් පොතේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට 35,000 ක් ලෙස සටහන් වීමට නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහන දැක්වෙන්නේ,
1. විකුණුම් ගිණුම හර 18,000
   අවිනිශ්චිත ගිණුම බැර 18,000
2. විකුණුම් ගිණුම හර 18,000
   මුදල් ගිණුම බැර 18,000
3. අවිනිශ්චිත ගිණුම හර 18,000
   විකුණුම් ගිණුම බැර 18,000
4. මුදල් ගිණුම හර 18,000
   අවිනිශ්චිත ගිණුම බැර 18,000

- පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 33 හා 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිණිමුතු තරුණ සමාජයේ සාමාජික මුදල් සම්බන්ධව 2024 වර්ෂයට අදාල පහත තොරතුරු දී ඇත.

2024-01-01 දිනට සිටි සාමාජිකයින් ගණන 150 මාසික සාමාජික ගාස්තුව රු. 100 කි.

2024 වර්ෂය තුල නව සාමාජිකයින් 20 දෙනෙකු ඇතුලත් වූ අතර 05 දෙනෙකු වසර මුලදී ඉවත් ව යන ලදී තවද සාමාජිකයින් 03 දෙනෙකු අවසන් මාස 03 සඳහා මුදල් ගෙවා නොමැත.

33. 2024-12-31 දිනට මිණිමුතු ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරන සාමාජික මුදල වනුයේ,
1. රු. 204,000 කි.
2. රු. 198,000 කි.
3. රු. 197,100 කි.
4. රු. 180,000 කි.

34. 2024 වර්ෂය සඳහා නොලැබුණු සාමාජික මුදල වන්නේ,
1. රු. 300 කි.
2. රු. 900 කි.
3. රු. 2400 කි.
4. රු. 3600 කි.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 35 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තාරුක ගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක් වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගැණුම් | 300,000 | |
| විකුණුම් | | 500,000 |
| 2023.01.01 දිනට තොගය | 60,000 | |
| විදුලි ගාස්තු | 10,000 | |
| ණයගැතියෝ | 50,000 | |
| ණයහිමියෝ | | 30,000 |
| යන්ත්‍ර සූත්‍ර (පිරිවැය) | 800,000 | |
| 10% බැංකු ණය | | 200,000 |
| කඩ කුලී ආදායම් | | 20,000 |
| ප්‍රචාරණය | 5,000 | |
| බැංකු ණය පොලී | 10,000 | |
| දුරකථන ගාස්තු | 15,000 | |
| 2023.01.01 ප්‍රාග්ධනය | | 500,000 |
| | 1250,000 | 1250,000 |

Learning Resource Center
R
De Mazenod College
Kandana

25361

අතිරේක තොරතුරු
1. 2023.12.31 දිනට ඉතිරි තොගය රු. 25,000 කි.
2. 2023.12.31 දිනට උපචිත විදුලි ගාස්තුව රු. 2000 කි.
3. යන්ත්‍ර සූත්‍ර සරල මාර්ග ක්‍රමය මත වාර්ෂිකව 10% ක් ක්ෂය කළ යුතුය.

35. තාරුකගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය
1. රු. 60,000 2. රු. 300,000 3. රු. 335,000 4. රු. 360,000

36. තාරුකගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය
1. රු. 115,000 2. රු. 165,000 3. රු. 300,000 4. රු. 335,000

37. තාරුකගේ ව්‍යාපාරයේ පරිපාලන වියදම්වල එකතුව වන්නේ,
1. රු. 25,000 2. රු. 27,000 3. රු. 80,000 4. රු. 107,000

38. තාරුකගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය
1. රු. 53,000 2. රු. 107,000 3. රු. 132,000 4. රු. 185,000

39. තාරුකගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය වන්නේ,
1. රු. 80,000 2. රු. 720,000 3. රු. 800,000 4. රු. 880,000

40. තාරුකගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට හිමිකම
1. රු. 453,000 2. රු. 500,000 3. රු. 553,000 4. රු. 795,000

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



Learning Resource
R
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුය :

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුර සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකරම කපා හරිනු ලැබේ.

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කේශරී සහ ඉෂානි පාසල් කාලයේ සිටම හොඳ මිතුරියන් දෙදෙනෙකි. උසස් පෙළ විභාගයෙන් පසුව ඇඳුම් මැසීමේ පාඨමාලාවක් (එක් අවුරුදු) හදාරා ඇති ඔවුන් වෙළඳපල තුල කුඩා ළමුන්ගේ ඇඳුම් සඳහා දැඩි ඉල්ලුමක් පවතින බවත් එවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීම වඩාත් ඵලදායි බවත් ඔවුන් අවබෝධ කර ගන්නාලද. මොරටුව නගර මධ්‍යයේ කුලියට ගත් ගොඩනැගිල්ලක 2024 ජනවාරි 01 දින "KE ෆැෂන් හවුස්" නමින් නව ව්‍යාපාරය ආරම්භ කළෝය. රු. 300,000 බැගින් දෙදෙනාම ප්‍රාග්ධනය යොදවා ජනවාරි 01 දින ආරම්භ කළ ව්‍යාපාරය සඳහා එදිනම වාර්ෂිකව 10% ක පොලියට රු. 600,000 ක බැංකු ණයක්ද ලබාගන්නා ලදී. ආරම්භක දිනයේදීම රු. 300,000 ක මහන මැෂින් මිලදී ගත් මෙම ව්‍යාපාරය මහජන බැංකුවේ ජංගම ගිණුමක්ද විවෘත කරන ලදී. ඇඳුම් මැසීමේ සේවිකාවන් දෙදෙනෙකුද ජනවාරි 01 බඳවා ගන්නා ලදී.

2024.01.31 දිනෙන් අවසන් මාසය තුල සිදු වූ ගනුදෙනු පහත දැක් වේ.

| | රු. |
|---|---|
| රෙදි මිලට ගැනුම් | 120,000 |
| ළමා ඇඳුම් මිලට ගැනුම් | 80,000 |
| ගොඩනැගිලි කුලී | 20,000 |
| නූල් හා අනෙකුත් ද්‍රව්‍ය | 10,000 |
| ඇඳුම් මසන්නියන්ගේ වැටුප | 30,000 |
| යන්ත්‍ර ක්ෂය | 5,000 |
| විදුලි ගාස්තු | 15,000 |
| මුරකරු වැටුප | 10,000 |
| ඇඳුම් විකිණීමෙන් | 390,000 |

ජනවාරි 31 දිනට ඉතිරි තොග කිසිවක් නොවීය.

(i) (අ) KE ෆැෂන් හවුස් ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?

(ආ) අරමුණ අනුව මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) (අ) KE ෆැෂන් හවුස් ව්‍යාපාරයට ඇති ශක්තීන් දෙකක් නම් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරය ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ වාසි දෙකක් නම් කරන්න.

(iii) (අ) ඉහත සිද්ධිය ඇසුරින් නිෂ්පාදන සාධක දෙකක් දක්වා නිදසුන බැගින් ලියා දක්වන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් නම් කරන්න.

(iv) (අ) KE ෆැෂන් හවුස් නාමය ලියා පදිංචි කල යුතු ද? හේතු දක්වන්න.
(ආ) KE ෆැෂන් හවුස් ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු පනත කුමක් ද?

(v) (අ) මෙම ව්‍යාපාරයේ 2024.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.
(ආ) KE ෆැෂන් හවුස් ව්‍යාපාරය ජංගම ගිණුම ආරම්භ කිරීමේදී රු. 5,000 ක් තැන්පත් කලේ නම් ඊට අදාල නිවැරදි ද්විත්ව සටහන වට්නාකම සහිතව ලියා දක්වන්න.

(vi) (අ) 2024.01.31 දිනට KE ෆැෂන් හවුස් ව්‍යාපාරයේ ගෙවිය යුතු ණය පොලිය සඳහා අදාල ද්විත්ව සටහන අගයන් සහිතව දක්වන්න.
(ආ) ඉහත (අ) හි දක්වන ලද ද්විත්ව සටහන වාර්තා කළ යුතු මුලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

(vii) 2024.01.31 දිනට KE ෆැෂන් හවුස් ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණ ද?

(viii) KE ෆැෂන් හවුස් ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසය සඳහා ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය වෙන වෙනම දක්වන්න.

(ix) 2024.01.31 දිනෙන් අවසන් මාසය සඳහා KE ෆැෂන් හවුස් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?

(x) 2024.01.31 දිනට KE ෆැෂන් හවුස් ව්‍යාපාරයේ මුළු වත්කම් හා මුළු හිමිකම ගණනය කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

---

## I කොටස
### ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

2. (i) ව්‍යාපාරයක අරමුණු ඉටු කර ගැනීමේදී විවිධ ඉලක්කයන් අවශ්‍ය වේ. එවැනි ඉලක්ක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) පෞද්ගලික අංශයේ සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරනුයේ ලාභ අරමුණින්ම වේ.
(ආ) ලාභ ඉපයීම ව්‍යාපාරයක ඉලක්කය කි.
(ඉ) අවශ්‍යතා නිර්මාණය කළ නොහැක.
(ඊ) සේවක සංඛ්‍යාව 25 ට වඩා අඩු ව්‍යාපාර සුළු පරිමාණ ව්‍යාපාර ලෙස 2007 අංක 07 සමාගම් පනත හඳුන්වා ඇත. (ලකුණු 2)

(iii) ව්‍යාපාරයකට ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ අරමුණු ලෙස රැකියා අවස්ථා උත්පාදනය කිරීම, සමාජ සුභසාධනයට දායක වන්නේ දැයි විමසා බැලීම හඳුනාගත හැක.
(අ) ඉහත දැක්වෙන ඡේදයේ ඇති අරමුණු දෙකට අදාල වන ඇල්මැති පාර්ශව නම් කරන්න.
(ආ) ව්‍යාපාරයකට එහි අයිතිකරුවන් දායකත්වය සපයන ආකාර සඳහා නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 2)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා වර්තමානයේ වඩාත් වැදගත් වන්නේ ව්‍යාපාරිකයින් බිහිවීම නොව ව්‍යවසායකයින් බිහි වීම යි.
(අ) ව්‍යවසායකත්වය නිර්වචනය කරන්න.
(ආ) සාර්ථක ව්‍යවසායකයෙකු වීමට ඔබ සිතන්නේ නම් ඔබ තුල තිබිය යුතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 8)

3. (i) ව්‍යාපාරයක බාහිර පරිසර සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන පරිසරයට අයත් වේ.

(ආ) භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව පහළ යාම උද්ධමනයයි.

(ඉ) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම ගෝලීයකරණයේ හිතකර ලක්ෂණයකි.

(ඊ) සේවයේ නියුතු අතිරික්ත සේවකයන් ප්‍රමාණය වැඩි නිසා ශ්‍රම පිරිවැය වැඩිවීම දෙපාර්තමේන්තුවල අවාසියකි. (ලකුණු 2)

(iii) ශෙනායාගේ ජංගම ගිණුම මිරිහාන මහජන බැංකුවේ පවත්වාගෙන යන්නීය. බැංකු අයිරාවක් ලබා ගැනීම සඳහා මිරිහාන මහජන බැංකු ශාඛාවේ කළමනාකරුට දුරකථන ඇමතුමක් මගින් ශෙනායා තම ඉල්ලීම සිදුකළා ය. මහජන බැංකු කළමනාකරු පණිවුඩය ලැබුණු පසු ජංගම ගිණුම පරීක්ෂාකර ඉක්මනින් අයිරා පහසුකම අනුමත කර දෙන බවට සහතික විය.

ඉහත සිද්ධියේ ඇතුලත් තොරතුරු සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග යටතේ රූප සටහන මගින් පෙන්නුම් කරන්න.



(ලකුණු 2)

(iv) රටක සංවර්ධනය සඳහා මාර්ග පද්ධතියේ හා ප්‍රවාහනයේ දියුණුව දැඩිව බලපෑම් ඇති කරයි. දියුණු රටවලමෙන් ශ්‍රී ලංකාවේද ප්‍රවාහන සේවයේ සංවර්ධනය වියයුතු පැතිකඩයන් බොහෝ ය.

(අ) ප්‍රවාහනයේ මූලිකාංගයක් ලෙස භාවිතා වන මාර්ග වර්ග කර දක්වන්න.

(ආ) දුම්රිය මාර්ග ප්‍රවාහනයේ අවාසි දෙකක් නම් කරන්න. (ලකුණු 2)

4. (i) කළමනාකරණ මූලිකාංගයක් වන සැලසුම්කරණය නිර්වචනය කරන්න. (ලකුණු 2)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක කළමනාකරු තම සේවකයන්ට අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීම මෙහෙයවීමට අයත් වේ.

(ආ) වෙළඳපලක් යනු ගැනුම්කරුවන් හා විකුණුම් කරුවන් හමුවන ඕනෑම ස්ථානයක් පමණි.

(ඉ) ප්‍රචාරණය යනු ප්‍රවර්ධනය යන විචල්‍යයට අයත් අයිතමයකි.

(ඊ) භාණ්ඩාගාර බිල්පත් යනු රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකිරීමට නිකුත් කරන සුරකුම්පත් විශේෂයකි. (ලකුණු 2)

(iii) මහා පරිමාණ නිෂ්පාදන ව්‍යාපාරයක් වන මදාරා සමූහ ව්‍යාපාරයේ 2025 වර්ෂයට අයවැය ඇස්තමේන්තුව සකස් කරන විට එහි අලෙවි දෙපාර්තමේන්තුවට වැඩි මුදලක් වෙන්කරන ලදී. එයට හේතු වූයේ ප්‍රචාරණ කටයුතු සවිමත් කොට භාණ්ඩ හෝ සේවාව පාරිභෝගිකයින් වෙත ආකර්ශනීය අයුරින් හඳුන්වාදීමටයි.

ඉහත සිද්ධිය ඇසුරින්

(අ) කළමනාකරණ මූලිකාංගයක් වන සංවිධානකරණය සඳහා නිදසුනක් ලියන්න. (ලකුණු 2)

(ආ) ඉහත සිද්ධියේ ඇතුලත් අලෙවිකරණයට අයත් වන කාර්යය නම් කරන්න.

(iv) රාජ්‍ය සේවිකාවක් වූ කල්‍යාණි මහත්මිය වසර 30 ක රාජ්‍ය සේවයෙන් 2025 ජනවාරි මස විශ්‍රාම යාමට බලාපොරොත්තු වේ. ඇයට හිමිවන විශ්‍රාම පාරිතෝෂිතය යොදා නිවසක් මිලට ගැනීමට අදහස් කරන්නීය.

(අ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක නම් කරන්න. (ලකුණු 2)

(ආ) ඉහත සිද්ධියේ දේපල මිලට ගැනීමේ ප්‍රතිලාභ දෙකක් නම් කරන්න. (මුළු ලකුණු 8)

## II කොටස

## ගිණුම්කරණය

5. (i) වියදම් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව සටහන ලියා දක්වන්න.

(අ) සේවක වැටුප් ගෙව්වා රු. 10,000

(ආ) සාලියගෙන් භාණ්ඩ ගැනුම් රු. 2000

(ඉ) අයිතිකරු පෞද්ගිලික ප්‍රයෝජනයට ගෙනගියා රු. 5000

(ඊ) ආයෝජන ආදායම් ලැබුනා රු. 20,000 (ලකුණු 2)

(iii) 2024.01.01 දිනට දැහැම්ගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර | 300,000 |
| ණයගැතියෝ | 30,000 |
| තොගය | 120,000 |
| මුදල් ශේෂය | 140,000 |
| බැංකු ණය | 50,000 |
| ණයහිමියෝ | 20,000 |

පහත ගනුදෙනු 2024 ජනවාරි මාසය තුල සිදුවිය.

01/04 භාණ්ඩ තොග ණයට ගැනුම් 15,000

01/09 ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා 5,000

01/21 පිරිවැය රු. 8,000 ක් වූ භාණ්ඩ රු. 12,000 කට ණයට විකුණුම්

01/30 බැංකු ණය ආපසු ගෙව්වා රු. 30,000

| ගනුදෙනු | වත්කම් | | | | හිමිකම් | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍රසූත්‍ර | තොග | ණයගැති | මුදල් | | බැංකු ණය | ණයහිමියෝ |
| | | | | | | | |
| ශේෂය | | | | | | | |

අවශ්‍ය වන්නේ,

1. දැහැම්ගේ ව්‍යාපාරයේ ආරම්භක ශේෂයන් දක්වමින් ඉහත ගනුදෙනු දී ඇති ගිණුම්කරණ සමීකරණයට ආදේශ කිරීම.
2. 2024.01.31 දිනට ජංගම වත්කම් වල අගය දැක්වීම (ලකුණු - 04)

(iv) පහත දැක්වෙන්නේ කවිඳුගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයකි.

3/05 පැතුම්ට ණයට භාණ්ඩ විකුණුම් රු. 20,000 (ඉ.අ. 120)

3/10 ව්‍යාපාරයේ පාවිච්චි කරමින් තිබූ රු. 50,000 යන්ත්‍රයන් ණයට විකිණීම (ජ'නල වවුචර අ. 150)

3/22 භාණ්ඩ තොගයක් දුමින්ද ට ණයට විකිණීම රු. 40,000 (ඉ.අ. 155)

3/26 භාණ්ඩ තොගයක් රු. 30,000 කට අත්පිට මුදලට විකිණීම (ලදුපත් අංක 160)

3/30 අසිතට රු. 15,000 ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම (ඉ.අ. 165)

අවශ්‍ය වන්නේ,

2024 මාර්තු මාසය සඳහා කවිඳුගේ ව්‍යාපාරයේ

(අ) විකුණුම් ජ'නලය

(අ) විකුණුම් ජ'නලය ගනුදෙනුවලට අදාල ලෙජර ගිණුම් (ලකුණු 4)

(මුළු ලකුණු 12)

6. (i) සුළු මුදල් පොතක වෙනත් ලෙජර ගිණුම් තීරුවේ ඇතුලත් කරන සුළු වියදම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) අග්‍රිම ක්‍රමයට සුළු මුදල් පොතක් පවත්වාගෙන යන කමනිගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත දැක්වේ.